අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය - 2011 අගෝස්තු

# General Certificate of Education (Adv. Level) Examination – August 2011

දේශපාලන විද්‍යාවේ මූලිකාංග I - පැය තුනයි

## Elements of Political Science I – Three hours

**උපදෙස් :**

- **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සැපයිය යුතු ය.
- 01 සිට 50 තෙක් එක් එක් ප්‍රශ්නයට (1), (2), (3), (4), (5) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ ඉතාමත් ගැළපෙන හෝ** පිළිතුර තෝරාගෙන එය **උත්තර පත්‍රයේ පසුපස දක්වෙන උපදෙස් පරිදි කතිරයක් (×) යොදා දක්වන්න.**
- එක් පිළිතුරකට ලකුණු 02 බැගින් මුළු ලකුණු 100 කි.

අංක 01 සිට 15 දක්වා ප්‍රශ්නවල සපයා ඇති ප්‍රකාශ පහ අතුරෙන් හතරක් පමණක් නිවැරදි වේ. නිවැරදි ප්‍රකාශ පමණක් ඇතුළත් කාණ්ඩය තෝරන්න.

01. දේශපාලන විද්‍යාව

A - සමාජ විද්‍යාවක් ලෙස සැලකේ.
B - මිනිසුන්ගේ දේශපාලන චර්යාව සහ දේශපාලන ක්‍රියාවන් අධ්‍යයනය කිරීම.
C - ස්වභාවික විද්‍යා සමඟ සමීපව සම්බන්ධ වේ.
D - මූලික විද්‍යාව වශයෙන් සැලකේ.
E - විධිමත් ලෙස අධ්‍යයනය කිරීම ඇරඹුණේ පැරණි ග්‍රීසිය තුළ ය.

(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

02. දේශපාලන විද්‍යාව උපකල්පනය කරන ආකාරයට

A - මිනිසා ස්වභාවයෙන් ම දේශපාලන ජීවියකු වන්නේ ය.
B - සෑම මිනිසෙක් ම උපතින් ම යම් ප්‍රමාණයක දේශපාලන ඥානයක් රැගෙන එන්නේ ය.
C - මිනිසුන් දේශපාලනය කථා කිරීම සහ එහි නියැළීම ස්වභාවික දෙයක් වන්නේ ය.
D - මිනිසුන්ට දේශපාලනය කොතරම් ස්වභාවික ද යත් මිනිසුන් දේශපාලනයෙන් වෙන් කළ නොහැකි වන්නේ ය.
E - දේශපාලනය සහ දේශපාලන විද්‍යාව අනන්‍ය සම වන්නේ ය.

(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

03. රාජ්‍යයේ ආරම්භය

A - දේවවරම් වාදයට අනුව දෙවියන් වහන්සේගේ නිර්මාණයක් වේ.
B - සමාජ සම්මුති වාදයට අනුව සමාජ සම්මුතියක ප්‍රතිඵලයක් වේ.
C - ලිබරල් වාදයට අනුව පොදු යහපත උදෙසා මිනිසුන් කළ නිර්මාණයක් වේ.
D - මාක්ස්වාදයට අනුව පෞද්ගලික දේපළ ක්‍රමය පැන නැගීමේ ප්‍රතිඵලයක් වේ.
E - පැසිස්ට් වාදයට අනුව දිගු සමාජ විකාශනයක ප්‍රතිඵලයක් වේ.

(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

04. නූතන න්‍යායන්ට අනුව නූතන රාජ්‍යවල හැඩගැස්ම කෙරෙහි බලපා ඇති සාධක වන්නේ,

A - ත්‍රස්තවාදය B - ඒකාබද්ධ කිරීම C - වෙන්වීම
D - ජාතිකවාදය E - පරිවර්තනය

(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

05. ආණ්ඩුව පිළිබඳව ඉදිරිපත් වී ඇති නිර්වචන කිහිපයක් වන්නේ,

A - මිනිස් සමාජය පාලනය කරන හා පරිපාලනය කරන සංවිධානය
B - මිනිස් සමාජය පාලනය කරන සංවිධානය
C - මිනිස් සමාජය කළමනාකරණය කරන සංවිධානය
D - රාජ්‍ය පාලනය කිරීම සඳහා සහභාගී වන පුද්ගල කණ්ඩායම අන්තර්ගත සංවිධානය
E - රාජ්‍යයේ දේශසීමාව තුළ ජීවත් වන සියලු ම දෙනා නියෝජනය කරන සංවිධානය

(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

06. ආණ්ඩුව සමාජ සංවිධානයක් වුව ද එය අනෙක් සමාජ සංවිධානවලින් වෙනස් වන්නේ,

A - බලාධිකාරි බලය පදනම් කරගෙන ඒකීය නීති පැනවීමට ඇති හැකියාව නිසා ය.
B - සුජාතභාවය මත ජනතාවගේ ජීවිතය හා මරණය ගැන තීන්දු ගත හැකි නිසා ය.

EXAMMOOD.LK
EXAMMOOD.LK

C - සාමාජිකයින් වුව ද නොවුව ද සියලු ම පුරවැසියන් කෙරෙහි රාජ්‍ය බලය යෙදවිය හැකි නිසා ය.
D - අනෙක් සමාජ සංවිධානවල පැවැත්ම පිළිබඳව තීරණය කළ හැකි නිසා ය.
E - රාජ්‍යයේ පැවැත්ම සම්බන්ධයෙන් අවසාන තීන්දු ගත හැකි නිසා ය.
(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

07. ආණ්ඩුව බලය ක්‍රියාවට නංවන මාර්ග වන්නේ,
A - ආණ්ඩුවේ බලය නීත්‍යානුකූල වේ යන අදහස විශ්වාස කිරීමට ජනතාව පොළඹවාලීම මගින්
B - වරදාන දීම සහ තර්ජනය කිරීම මගින්
C - බලය යෙදවීම මගින්
D - ආගමික සහ සදාචාර විශ්වාස මගින්
E - දඬුවම් කිරීම මගින්
(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

08. ආණ්ඩුවේ බලය පාලනය කළ හැකි මාර්ග වන්නේ,
A - පොලීසිය සහ සිවිල් සේවය
B - ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව
C - බලතල බෙදීම.
D - සංවරණය හා තුලනය
E - අධිකරණ විවරණ බලය
(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

09. මහජනතාව ආණ්ඩුව සමඟ යා කරන මාර්ග වන්නේ,
A - මැතිවරණ
B - ජනමත විචාරණය
C - දේශපාලන පක්ෂ
D - රාජ්‍ය නොවන සංවිධාන
E - බලපෑම් කණ්ඩායම් සහ මහජන මතය
(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

10. දේශපාලන හා ආර්ථික මතවාද අනුව ආණ්ඩුක්‍රම වර්ග කරන ක්‍රම වන්නේ,
A - ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී
B - කර්ීපයාධිකාරී
C - නව ලිබරල්වාදී
D - සමාජවාදී
E - සමාජ ප්‍රජාතන්ත්‍රවාදී
(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

11. කැබිනට් ආණ්ඩුක්‍රමය ජනාධිපති ආණ්ඩුක්‍රමයෙන් වෙනස්වන සාධක වන්නේ,
A - විධායකය තේරීපත්වන ආකාරය
B - විධායක, ව්‍යවස්ථාදායක සම්බන්ධතා
C - ආණ්ඩුවේ ව්‍යුහයන් හා කාර්යයන්
D - ප්‍රජාතාන්ත්‍රිකභාවයේ ප්‍රමාණය
E - ස්ථාවරභාවය හා කාර්යක්ෂමභාවය
(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

12. විධායක බලය ක්‍රියාවට නංවන ආකාරය අනුව ආණ්ඩු වර්ග කරනු ලබන්නේ,
A - කැබිනට් හෙවත් පාර්ලිමේන්තු
B - සමාජ ප්‍රජාතන්ත්‍රවාදී
C - ජනාධිපති
D - මිශ්‍ර විධායක
E - ඒකතන්ත්‍ර
(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

13. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව
A - ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුකරණයේ මූලික පදනම වේ.
B - රටේ මූලික නීතිය ලෙස සැලකේ.
C - රාජ්‍ය සහ ආණ්ඩුව සංවිධානය කිරීමේ මූලධර්මවල එකතුව වේ.
D - ආණ්ඩුක්‍රමයේ නීතිමය පදනම වේ.
E - රාජ්‍යයේ මූලික අරමුණු විදහා දක්වන ලියවිල්ල වේ.
(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

14. ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුකරණයේ ප්‍රධානතම මූලිකාංග කිහිපයක් වන්නේ,
A - ආණ්ඩුක්‍රමය ව්‍යවස්ථාවක් මත ක්‍රියාත්මක වීම සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට ගරු කිරීම.
B - ආණ්ඩුකරණයේ පාරදෘශ්‍යභාවය සහ පාලකයින් ජනතාවට වගකීම.

EXAMMOOD.LK

C - නීතියේ අධිපතිත්වයට ගරු කිරීම සහ අධිකරණයේ ස්වාධීනත්වය
D - මාධ්‍ය ඇතුළුව සිවිල් සමාජ ක්‍රියාකාරිත්වයට නිදහස තිබීම.
E - මානව අයිතිවාසිකම් සීමා කිරීම.
(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

15. ආණ්ඩුවක මූලික කාර්යයන් කිහිපයක් වන්නේ,
A - නීතිය සහ සාමය පවත්වාගෙන යාම.
B - ජාතික ආරක්ෂාව තහවුරු කිරීම.
C - ජාතික ආර්ථිකය හා ජාතික සුබසාධනය ඉහළ නැංවීම.
D - බෙදාහැරීමේ යුක්තියට අනුව පුරවැසියන්ට සැලකීම.
E - විදේශ සම්බන්ධතා පවත්වා ගෙන යාම.
(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

✪ අංක 15 සිට 25 දක්වා ප්‍රශ්නවල සපයා ඇති ප්‍රකාශ පහ අතුරින් එක් ප්‍රකාශයක් වැරදි ය. **වැරදි** ප්‍රකාශය තෝරන්න.

16. නිදහස් සහ සාධාරණ මැතිවරණයක මූලික ලක්ෂණ වන්නේ,
(1) කාලීනව පැවැත්වීම.
(2) තාර්කිකව තීරණ ගැනීම සඳහා ඡන්දදායකයාට පූර්ණ නිදහස තිබීම.
(3) සුදුසුකම් සහිත ඕනෑම අයෙකුට අපේක්ෂකයකු ලෙස ඉදිරිපත් විය හැකි වීම.
(4) නුසුදුසුකම් නොසලකමින් සෑම අයෙකුට ම ඡන්ද බලය ලබා දීම.
(5) සෑම ඡන්දයක් ම ගණනය කිරීම සහ ප්‍රතිඵල විවෘතව සහ නිවැරදිව දැක්වීම.

17. දේශපාලන පක්ෂ
(1) බල අරගලයේ ප්‍රධාන රඟුම්කරුවන් වේ.
(2) සමාජ ප්‍රතිසංස්කරණ ක්‍රියාදාමයේ වැදගත් නියෝජිතයින් වේ.
(3) ජනතා සහ කේඩර ලෙස වර්ගීකරණය කරනු ලැබේ.
(4) ප්‍රජාතන්ත්‍රවාදයේ ක්‍රියාකාරිත්වය සඳහා අවශ්‍ය නොවේ.
(5) දේශපාලන සමාජානුයෝජන ක්‍රියාදාමයේ වැදගත් නියෝජිතයින් වේ.

18. බලපෑම් කණ්ඩායම්
(1) ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලනයේ වැදගත් ක්‍රියාකාරිකයින් වේ.
(2) ආණ්ඩුවට තොරතුරු සපයන වැදගත් මූලාශ්‍ර වේ.
(3) පෞද්ගලික අරමුණු ප්‍රවර්ධනය කිරීම අරමුණු කොටගෙන ගොඩනගා තිබේ.
(4) ආශා කණ්ඩායම් ලෙස ද හැඳින්වේ.
(5) බහුල ලෙස සංවිධානය කර ඇත්තේ නාගරික කම්කරුවන් විසිනි.

19. දේශපාලන සමාජානුයෝජනයේ ඒජන්තවරුන් වන්නේ,
(1) පවුල, පාඨශාලාව සහ සම වයස් කණ්ඩායම්
(2) කටකථා සහ සුරංගනා කථා
(3) ආගමික සංවිධාන
(4) දේශපාලන පක්ෂ සහ ආණ්ඩුව
(5) සමාජ මට්ටම සහ ආර්ථික පසුබිම

20. රාජ්‍ය පරිපාලනය
(1) ආණ්ඩුවේ ක්‍රියාකාරී අංශ වේ.
(2) ආණ්ඩුවේ අරමුණු ඉටුකර ගැනීමේ යාන්ත්‍රණය වේ.
(3) ආණ්ඩුවේ පරිපාලනය ගැන පමණක් සැලකිලිමත් වේ.
(4) පෞද්ගලික අංශයේ පරිපාලනයේ කොටසක් වේ.
(5) දේශපාලන මැදිහත්වීම්වලින් තොරව තබා ගත යුතු වේ.

21. රාජ්‍ය ප්‍රතිපත්ති
(1) විශේෂිත ඉලක්ක සපුරා ගැනීමේ අරමුණෙන් සැලසුම් කරනු ලැබේ.
(2) පොදු ප්‍රශ්න විසඳීම අපේක්ෂා කරනු ලැබේ.
(3) දේශපාලන ක්‍රමයක ප්‍රධානතම නිමැවුම වේ.
(4) පෞද්ගලික අංශයේ තීරණ හා ප්‍රතිපත්ති වේ.
(5) ජන ජීවිතයට විවිධාකාරයෙන් දැඩි ලෙස බලපානු ලැබේ.

EXAMMOOD.LK
EXAMMOOD.LK

22. අන්තර්ජාතික දේශපාලනය
(1) ජාතීන් අතර කෙරෙන්නා වූ දේශපාලනය ලෙස ද හැඳින්වේ.
(2) නිදහස්, ස්වාධිපති, ජාතික රාජ්‍යයන් අතර කෙරෙන්නා වූ දේශපාලනය ලෙස ද හැඳින්වේ.
(3) රාජ්‍යයන් සහ එක්සත් ජාතීන්ගේ සංවිධානය අතර කෙරෙන්නා වූ දේශපාලනය ලෙස ද හැඳින්වේ.
(4) ලෝක දේශපාලනය ලෙස ද හැඳින්වේ.
(5) ජාතීන්ගේ බල අරගලය ලෙස ද හැඳින්වේ.

23. අන්තර්ජාතික දේශපාලනයේ ප්‍රධාන රඟුම්කරුවන් වන්නේ,
(1) පුද්ගලයින්
(2) නිදහස් ස්වාධිපති ජාතික රාජ්‍යයන්
(3) අන්තර් රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධාන
(4) බහුජාතික සමාගම්
(5) බලපෑම් සහගත ඉතා වැදගත් පුද්ගලයින්

24. ගැටුම
(1) සමහර සමාජයන්හි පමණක් තිබෙන්නා වූ සමාජ ප්‍රපංචයක් වේ.
(2) පුද්ගල හා සමාජ විවිධත්වයේ අවසාන ප්‍රතිඵලය වේ.
(3) මතභේදය, අර්බුදය, කළහ කිරීම හා ප්‍රචණ්ඩත්වය සමඟ සමානාර්ථයෙන් හඳුනා ගනියි.
(4) පුද්ගල හා කණ්ඩායම්වල බහුවිධ ආශාවන් ප්‍රකාශ කිරීමේ එක් මාධ්‍යයක් වේ.
(5) ප්‍රවර්ධනාත්මක මෙන් ම විනාශකාරී ද විය හැක.

25. ගැටුම්වල මූලික ලක්ෂණ වන්නේ,
(1) ප්‍රතිවිරුද්ධ රඟුම්කරුවන් දෙදෙනකු හෝ වැඩි ප්‍රමාණයක් සිටීම.
(2) ප්‍රතිවිරුද්ධ කණ්ඩායම් ප්‍රකෝපකාරී ලෙස හැසිරීම.
(3) තීව්‍රතාව ගණනය කිරීමට හා මැනීමට හැකි වීම.
(4) සාධනාත්මක හෝ නිෂේධනාත්මක ප්‍රතිඵල සහිත වීම.
(5) හිංසාකාරී මාර්ගවලින් පමණක් විසඳිය හැකි වීම.

○ අංක 26 සිට 34 දක්වා ප්‍රශ්නවල සපයා ඇති ප්‍රකාශ පහ අතුරෙන් හතරක් පමණක් නිවැරදි වේ. නිවැරදි ප්‍රකාශ පමණක් ඇතුළත් කාණ්ඩය තෝරන්න.

26. බ්‍රිතාන්‍ය පාලනය යටතේ ලංකාවේ ආර්ථිකයේ සිදු වූ වැදගත් වෙනස්කම් කිහිපයක් වන්නේ,
A - නිදහස් ශ්‍රම වෙළඳපොළක් නිර්මාණය වීම.
B - වාණිජ වතු වගාව හඳුන්වා දීම.
C - ආයාත - නිර්යාත ආර්ථික ක්‍රමයක් වර්ධනය වීම.
D - දේශීය ව්‍යාපාරික පන්තියක් බිහිවීම.
E - බ්‍රිතාන්‍ය මිෂනාරිවරුන්ගේ පැමිණීම.
(1) ABCD　(2) BCDE　(3) ABDE　(4) ACDE　(5) ABCE

27. බ්‍රිතාන්‍ය පාලනය යටතේ ලංකාවේ ආණ්ඩුකරණය තුළ ඇති වූ වැදගත් වර්ධනයන් කිහිපයක් වන්නේ,
A - නියෝජ්‍ය ආණ්ඩුක්‍රමය
B - ස්වාධීන අධිකරණය
C - වෘත්තීය රාජ්‍ය පරිපාලන සේවාව
D - ද්විත්ව පාලන ක්‍රමය
E - වගකිව යුතු ආණ්ඩුකරණය
(1) ABCD　(2) BCDE　(3) ABDE　(4) ACDE　(5) ABCE

28. ශ්‍රී ලංකාව තුළ ජාතික ව්‍යාපාරය පැන නැගීම කෙරෙහි බලපෑ සාධක වන්නේ,
A - බටහිර අධ්‍යාපනය ලද මධ්‍යම පන්තියේ නැගී ඒම.
B - ආගමික පුනර්ජීවන ව්‍යාපාරය
C - 1911 දී ආරම්භ වූ අමද්‍යප ව්‍යාපාරය
D - භාෂා ප්‍රශ්නය මත වාර්ගික කණ්ඩායම් අතර ඇතිවන බෙදීම.
E - වගකිව යුතු ආණ්ඩුවක් ලබා ගැනීමේ අවශ්‍යතාව
(1) ABCD　(2) BCDE　(3) ABDE　(4) ACDE　(5) ABCE

EXAMMOOD.LK
EXAMMOOD.LK

29. ශ්‍රී ලංකාවේ වාමාංශික ව්‍යාපාරය
- A - ආරම්භ වූයේ 1940 දශකයේ අගභාගයේ දී ය.
- B - මෙහෙයවූයේ වාමාංශික මතධාරී මධ්‍යම පාංතික රැඩිකල් තරුණයින් විසිනි.
- C - අරමුණ වූයේ ශ්‍රී ලංකාව තුළ සමාජවාදී රාජ්‍ය ක්‍රමයක් පිහිටුවීම ය.
- D - ආරම්භක අවස්ථාවේ දී ව්‍යාප්ත වූයේ නාගරික ප්‍රදේශවල පමණි.
- E - සංවිධානාත්මක ව්‍යාපාරයක් බවට පත්වූයේ 1935 දී ල.ස.ස.ප. පිහිටුවීමෙන් පසුව ය.

(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

30. ඩොනමෝර් ආණ්ඩුක්‍රමයේ මූලිකාංග කිහිපයක් වන්නේ,
- A - ආණ්ඩුක්‍රමය ද්විත්ව විධායකයක් මත පදනම් වීම.
- B - ලාංකිකයින් සත් දෙනෙකුගෙන් සහ රාජ්‍ය නිලධාරීන් තිදෙනෙකුගෙන් සමන්විත අමාත්‍ය මණ්ඩලය
- C - සර්වජන ඡන්ද බලය
- D - මුදල්, රාජ්‍ය සේවය හා අධිකරණය පාලනය කිරීමේ විධායක බලතල ලාංකිකයින්ට හිමිවීම.
- E - ඡන්ද කොට්ඨාස පදනමෙන් නියෝජිතයින් 50 ක් තෝරා ගැනීම.

(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

31. සෝල්බරි ආණ්ඩුක්‍රමයේ මූලිකාංග වන්නේ,
- A - බ්‍රිතාන්‍ය කිරීටයේ නායකත්වය සහිත ආණ්ඩුක්‍රමය
- B - අගමැති සහ කැබිනට් මණ්ඩලය සත්‍ය විධායකය වූ පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමය
- C - නීති සම්පාදනයේ ලා පූර්ණ බලය සහිත ද්වි මාණ්ඩලික ව්‍යවස්ථාදායකය
- D - බ්‍රිතාන්‍ය රාජාධිකරණය මුල්තැන ගත් අධිකරණ ක්‍රමය
- E - අධිකරණයේ සහ රාජ්‍ය සේවයේ ස්වාධීනත්වය උදෙසා පත්කළ කොමිෂන් සභා ද්විත්වය

(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

32. සුළුතර කණ්ඩායම්වල ආරක්ෂාව උදෙසා සෝල්බරි ව්‍යවස්ථාවෙන් සැපයූ ව්‍යවස්ථා ආවරණ වන්නේ,
- A - අයිතිවාසිකම් පනත
- B - සෙනෙට් මණ්ඩලය සහ මහජන මන්ත්‍රී මණ්ඩලයට නාමකරණයෙන් නියෝජිතයින් හයදෙනෙකු පත් කිරීම
- C - බහු මන්ත්‍රී ඡන්ද කොට්ඨාස
- D - ස්වාධීන අධිකරණය හා රාජ්‍ය සේවය
- E - 29 වන වගන්තිය

(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

33. 1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව
- A - ශ්‍රී ලංකාව නිදහස්, ස්වාධීන, ස්වෛරී, ඒකීය රාජ්‍යයක් බවට පත් කළේ ය.
- B - ආණ්ඩුක්‍රම යාන්ත්‍රණය බලතල බෙදීමේ මූලධර්මය මත ගොඩ නගන ලදී.
- C - බුද්ධාගමට ප්‍රමුඛස්ථානය දෙන ලදී.
- D - බ්‍රිතාන්‍ය සමඟ පැවති සියලු ව්‍යවස්ථානුකූල සම්බන්ධතා අත්හරින ලදී.
- E - පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමය අඛණ්ඩව පවත්වාගෙන යන ලදී.

(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

34. 1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික ලක්ෂණ කිහිපයක් වන්නේ,
- A - සත්‍ය විධායකයේ නායකයා විසින් නාමික විධායකය පත් කිරීම.
- B - විධායක, ව්‍යවස්ථාදායක හා අධිකරණ බලතල සංකේන්ද්‍රණය වූ සර්වාධිපති ව්‍යවස්ථාදායකය
- C - පනත්වල ව්‍යවස්ථානුකූලභාවය පරීක්ෂා කිරීමේ බලය සහිත අධිකරණය
- D - සහතික කිරීම සඳහා නීතිමය ආවරණය රහිත මූලික අයිතිවාසිකම් පරිච්ඡේදය
- E - සමාජ ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක් ගොඩනැගීම අරමුණු කරගත් රාජ්‍ය ප්‍රතිපත්ති මූලධර්ම මාලාව

(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

EXAMMOOD.LK

❂ අංක 35 සිට 38 දක්වා ප්‍රශ්නවල සපයා ඇති ප්‍රකාශ අතුරින් එක් ප්‍රකාශයක් වැරදි ය. **වැරදි** ප්‍රකාශය තෝරන්න.

35. 1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ සත්‍ය විධායකය
   (1) අමාත්‍ය මණ්ඩලය නමින් හඳුන්වන ලදී.
   (2) සමන්විත වූයේ අගමැති සහ අමාත්‍යවරුන්ගෙනි.
   (3) පත් කරනු ලැබුයේ ජනාධිපතිවරයා විසිනි.
   (4) වගකීමට බැඳී සිටියේ ජනාධිපතිවරයාට ය.
   (5) ව්‍යවස්ථාදායකය සම්මත කරන විශ්වාසභංග යෝජනාවකින් ඉවත් කළ හැකි විය.

36. 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින්
   (1) විධායක ජනාධිපති ආණ්ඩුක්‍රමය හඳුන්වා දුන්නේ ය.
   (2) පාර්ලිමේන්තුවේ නියෝජිතයින් තෝරාපත්කර ගැනීම සඳහා සමානුපාතික නියෝජන ක්‍රමය ඇති කළේ ය.
   (3) ඔම්බුඩ්ස්මන් තනතුර පිහිටවූයේ ය.
   (4) ශ්‍රේෂ්ඨාධිකරණයට අධිකරණ විවරණ බලය පැවරී ය.
   (5) පාර්ලිමේන්තුව අර්ධ ස්වාධිපති ආයතනයක් බවට පත් කළේ ය.

37. 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ ජනාධිපතිවරයා
   (1) රාජ්‍යයේ, ආණ්ඩුවේ සහ විධායකයේ නායකයා මෙන් ම හමුදාවල ප්‍රධාන අණදෙන නිලධාරියා වේ.
   (2) 42 වන වගන්තියට අනුව පාර්ලිමේන්තුවට වගකිව යුතු ය.
   (3) පාර්ලිමේන්තුව සම්මත කරන දෝෂාභියෝගයක් මගින් නිලයෙන් ඉවත් කිරීමට යටත් වේ.
   (4) සය අවුරුදු නිල කාලයක් සඳහා ජනතාව විසින් පත් කරනු ලැබේ.
   (5) ස්ව අභිමතය අනුව ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකරුවන් ඉවත් කිරීමේ බලය ඇත.

38. 1978 ව්‍යවස්ථාව යටතේ ශ්‍රේෂ්ඨාධිකරණය
   (1) මූලික නීතිය යටතේ පිහිටුවා ඇත.
   (2) අධිකරණ පද්ධතියේ ඉහළ ම අධිකරණය වන්නේ ය.
   (3) සමන්විත වන්නේ අග විනිසුරු සහ තවත් විනිසුරුවන් 6 - 10 දක්වා ප්‍රමාණයකින් ය.
   (4) ස්වකීය තීරණ සම්බන්ධයෙන් ජනාධිපතිවරයාට වගකිව යුතු ය.
   (5) ජනාධිපතිවරයාට උපදේශාත්මක මත ලබාදීමට බැඳී ඇත.

❂ පහත දක්වා ඇත්තේ 1972 සහ 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා යටතේ සංස්ථාපනය කළ ව්‍යවස්ථාදායක සභාවලට අදාළ වන ප්‍රකාශ කිහිපයක් ය. ඒවා ඇසුරින් අංක 39 සහ 40 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A - ජාතික රාජ්‍ය සභාව ලෙස හැඳින්වීය.
B - ඡන්දයෙන් සහ නාමකරණයෙන් පත් වූ නියෝජිතයින්ගෙන් සමන්විත වන්නේ ය.
C - ඡන්දයෙන් තේරීපත් වූ නියෝජිතයන්ගෙන් පමණක් සමන්විත විය.
D - නියෝජිතයින්ගේ සංඛ්‍යාව නිශ්චිත ලෙස දක්වා ඇත.
E - විසුරුවා හැරීම සීමාවන්ට යටත් නොවී ය.
F - විසුරුවා හැරීම යම් යම් සීමාවන්ට යටත් වේ.
G - රාජ්‍ය බලය ක්‍රියාවට නැංවීමේ උත්තරීතර හස්තය ලෙස සැලකිණ.
H - ව්‍යවස්ථාදායක බලය උත්තරීතර නොවේ.
I - ද්වි මාණ්ඩලික විය.
J - සභාව කල් තැබීමේ බලය පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයා සතු විය.

39. 1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ පිහිට වූ ව්‍යවස්ථාදායක සභාවට අදාළ ප්‍රකාශ ඇතුළත් කාණ්ඩය තෝරන්න.
   (1) ABCD   (2) EFGH   (3) AHIJ   (4) ACEG   (5) CDEG

40. 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ සංස්ථාපනය කළ ව්‍යවස්ථාදායකයට අදාළ ප්‍රකාශ ඇතුළත් කාණ්ඩය තෝරන්න.
   (1) ABDE   (2) BDFH   (3) EGHI   (4) CDEF   (5) BDFJ

EXAMMOOD.LK
EXAMMOOD.LK

❂ ශ්‍රී ලංකාවේ පළාත් සභා ක්‍රමය සහ පළාත් පාලන ආයතන ක්‍රමය කෙරෙහි අදාළ වන ප්‍රකාශ කිහිපයක් පහත දක්වා ඇත. ඒවා ඇසුරින් අංක **41** සහ **42** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A - රටේ මූලික නීතිය යටතේ පිහිටුවා ඇත.
B - ව්‍යවස්ථාදායක අණපනත් මගින් සංස්ථාපනය කර ඇත.
C - ප්‍රධාන කාර්යය වන්නේ අදාළ බල ප්‍රදේශය තුළ භෞතික කටයුතු සංවර්ධනය කිරීම ය.
D - නිල කාලය අවුරුදු පහකි.
E - ආණ්ඩුකාරයාගේ උපදෙස් මත ජනාධිපතිට විසුරුවා හැරිය හැක.
F - ප්‍රඥප්ති සෑදීමේ බලය ඇත.
G - අමාත්‍ය මණ්ඩලය පාර්ලිමේන්තුවට වගකිව යුතු ය.
H - බලය ඇත්තේ අනුනීති සෑදීමට පමණි.
I - සමන්විත වන්නේ ආයතන වර්ග තුනකිනි.
J - සමානුපාතික නියෝජන ක්‍රමය යටතේ නියෝජිතයින් පත් කෙරේ.

41. පළාත් සභා ක්‍රමයට අදාළ ප්‍රකාශ ඇතුළත් කාණ්ඩය තෝරන්න.
(1) ABCD (2) EFGH (3) GHIJ (4) ADFJ (5) ADIJ

42. පළාත් පාලන ක්‍රමයට අදාළ ප්‍රකාශ ඇතුළත් කාණ්ඩය තෝරන්න.
(1) ADEJ (2) BDFG (3) BCHI (4) GHIJ (5) CDFG

❂ අංක **43** සිට **50** දක්වා ප්‍රශ්නවල සපයා ඇති ප්‍රකාශ පහ අතුරින් හතරක් මාතෘකාවට අදාළ නොවේ. අදාළ නොවන ප්‍රකාශ ඇතුළත් කාණ්ඩය තෝරන්න.

43. ශ්‍රී ලංකාවේ දේශපාලන පක්ෂ ක්‍රමය
A - බහුපක්ෂ ක්‍රමයකි.
B - ද්විපක්ෂ ක්‍රමයකි.
C - ඒකපක්ෂ නායකත්වය සහිත බහුපක්ෂ ක්‍රමයකි.
D - කේඩර පක්ෂවලින් පමණක් සමන්විත ක්‍රමයකි.
E - ඒකපක්ෂ ක්‍රමයකි.
(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

44. ශ්‍රී ලංකාවේ බලපෑම් කණ්ඩායම්
A - ප්‍රධාන වශයෙන් සංවිධානය කර ඇත්තේ වෘත්තිය හා ආගමික කරුණු මුල්කර ගෙන ය.
B - ආණ්ඩුවෙන් සපයන ආධාර මත ක්‍රියාත්මක වේ.
C - මධ්‍යම බල අධිකාරියක් මගින් පාලනය වේ.
D - ඉතා ම දුර්වල වන බැවින් බලපෑම් කළ හැකි ප්‍රමාණය සීමිත ය.
E - දේශපාලනයෙන් මුළුමනින් ම තොර ය.
(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

45. එක්සත් ජාතීන්ගේ සංවිධානය
A - පුළුල් අරමුණු සහිත ලෝක පරිමාණ සංවිධානයක් වේ.
B - සීමිත අරමුණු සහිත ලෝක පරිමාණ සංවිධානයක් වේ.
C - සාම අරමුණු සහිත ලෝක පරිමාණ සංවිධානයක් වේ.
D - යුද්ධ අරමුණු සහිත ලෝක පරිමාණ සංවිධානයක් වේ.
E - දේශපාලන අරමුණු සහිත ලෝක පරිමාණ සංවිධානයක් වේ.
(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

46. දකුණු ආසියාතික කලාපීය සහයෝගිතා සංවිධානය
A - ආරක්ෂක අරමුණු සහිත කලාපීය මට්ටමේ සංවිධානයක් වේ.
B - සීමිත අරමුණු සහිත කලාපීය මට්ටමේ සංවිධානයක් වේ.
C - යුද්ධ හා සාම අරමුණු සහිත කලාපීය මට්ටමේ සංවිධානයක් වේ.
D - ආර්ථික හා දේශපාලන අරමුණු සහිත කලාපීය මට්ටමේ සංවිධානයක් වේ.
E - ආර්ථික හා සමාජ අරමුණු සහිත කලාපීය මට්ටමේ සංවිධානයක් වේ.
(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

EXAMMOOD.LK

47. පොදු රාජ්‍ය මණ්ඩලය
A - මැදි මට්ටමේ රාජ්‍ය නොවන සංවිධානයක් වේ.
B - 1944 දී බ්‍රිතාන්‍ය, කැනඩාව සහ ඕස්ට්‍රේලියාව අත්සන් කළ ප්‍රඥප්තිය මත පිහිටුවා ඇත.
C - බ්‍රිතාන්‍ය අගමැති නායකත්වය දරනු ලැබේ.
D - බ්‍රිතාන්‍ය අධිරාජ්‍යයේ යටත් විජිත වශයෙන් පැවති රාජ්‍යයන්ගේ එකමුතුවකි.
E - කොමියුනිස්ට් වාදයට එරෙහිව සටන් වැදීම සඳහා පිහිට වූ යුධ සංවිධානයක් ය.
(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

48. අන්තර්ජාතික දේශපාලනය තුළ රාජ්‍ය වර්ග කරන ආකාරය අනුව - ශ්‍රී ලංකාව
A - කුඩා බලවතෙක් ය.
B - මැදි මට්ටමේ බලවතෙක් ය.
C - මහ බලවතෙක් ය.
D - සුපිරි බලවතෙක් ය.
E - කලාපීය බලවතෙක් ය.
(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

49. ශ්‍රී ලංකාවේ විදේශ ප්‍රතිපත්තිය සම්පාදනයේ ප්‍රධාන රැඟුම්කරුවා වන්නේ,
A - විදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්වරයා
B - අගමැති
C - කැබිනට් මණ්ඩලය
D - විදේශීය කටයුතු භාර ඇමතිවරයා
E - ජනාධිපති
(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

50. අන්තර්ජාතික රතු කුරුස කමිටුව
A - යුද්ධයෙන් පීඩාවට පත්වන අයගේ සුබසාධනය සඳහා ක්‍රියාකරන රාජ්‍ය නොවන සංවිධානයක් ය.
B - යුද්ධයෙන් පීඩාවට පත්වන අයගේ සුබසාධනය සඳහා ක්‍රියාකරන අන්තර් රාජ්‍ය සංවිධානයක් ය.
C - ලෝක උරුමයන් ආරක්ෂා කිරීම සඳහා ක්‍රියාකරන අන්තර් රාජ්‍ය සංවිධානයක් ය.
D - මත්ද්‍රව්‍ය ප්‍රවාහනයට එරෙහිව ක්‍රියාකරන අන්තර් රාජ්‍ය සංවිධානයක් ය.
E - කාන්තා අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සහ ප්‍රවර්ධනය කිරීම සඳහා ක්‍රියාකරන අන්තර් රාජ්‍ය සංවිධානයක් ය.
(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

*****

EXAMMOOD.LK
EXAMMOOD.LK

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය - 2011 අගෝස්තු

**General Certificate of Education (Adv. Level) Examination – August 2011**

**දේශපාලන විද්‍යාවේ මූලිකාංග II - පැය තුනයි**

# Elements of Political Science II – Three hours

**උපදෙස් :**

✠ මෙම ප්‍රශ්න පත්‍රය **A, B** හා **C** වශයෙන් කොටස් තුනකින් යුක්ත ය.

✠ **A** කොටස තුළ කෙටි ප්‍රශ්න 20 ක් අන්තර්ගත වේ. සම්පූර්ණ පිළිතුරක් සඳහා ලකුණු 01 ක් ද, අර්ධ පිළිතුරක් සඳහා ලකුණු ½ ක් ද හිමි වේ. මෙම කොටසේ **සියලු ම** ප්‍රශ්නවලට කෙටි පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේ ම සපයා B හා C කොටස්වල පිළිතුරු පත්‍රයට අමුණා භාර දෙන්න.

✠ B හා C කොටස්වලින් ප්‍රශ්න **දෙක** බැගින් තෝරාගෙන ප්‍රශ්න **හතරකට** පමණක් පිළිතුරු සපයන්න.

## A කොටස

01. "දේශපාලන විද්‍යාව විද්‍යාත්මකව අධ්‍යයනය කළ නොහැකි බව පොදුවේ පිළිගත් මතයක් වන්නේ ය." මෙම මතය සනාථ කිරීම සඳහා ඉදිරිපත් කර ඇති තර්ක **දෙකක්** දක්වන්න.

1. ..........................................................
2. ..........................................................

02. චර්යාවාදයේ මූලිකාංග **දෙකක්** දක්වන්න.

1. ..........................................................
2. ..........................................................

03. රාජ්‍ය, සමාජයෙන් වෙනස්වන සාධක **දෙකක්** සඳහන් කරන්න.

1. ..........................................................
2. ..........................................................

04. "ස්වාධිපති න්‍යායයේ" සහ "බලතල බෙදීමේ න්‍යායයේ" නිර්මාතෘවරුන් **දෙදෙනා** කවුරුන් ද?

1. ..........................................................
2. ..........................................................

05. "කුමාරයා" කෘතියේ සහ "සිවිල් ආණ්ඩුව පිළිබඳ සම්මුතීන් දෙකක්" යන කෘතියේ කර්තෘවරුන් **දෙදෙනා** නම් කරන්න.

1. ..........................................................
2. ..........................................................

06. මිනිසුන් නීතියට යටත්වන්නේ ඇයි ? හේතු **දෙකක්** දක්වන්න.

1. ..........................................................
2. ..........................................................

07. "මිනිසුන් දේශපාලනය ඉගෙන ගන්නා මාර්ග කොටස් දෙකකට බෙදනු ලැබේ." එම කොටස් **දෙක** නම් කරන්න.

1. ..........................................................
2. ..........................................................

08. "දේශපාලන පක්ෂ විසින් කාර්යයන් විශාල ප්‍රමාණයක් ඉටු කරනු ලැබේ." ඒවායින් **දෙකක්** සඳහන් කරන්න.

1. ..........................................................
2. ..........................................................

09. "නූතන ආණ්ඩුක්‍රමය තුළ ව්‍යවස්ථාදායකය සංවිධානය කිරීම සඳහා යොදා ගැනෙන ආකෘති දෙකක් ඇත." එම ආකෘති **දෙක** නම් කරන්න.

1. ..........................................................
2. ..........................................................

10. "රාජ්‍යයක ස්ව-අනන්‍යතාවය පවත්වාගෙන යාම සම්බන්ධයෙන් දේශපාලන සංකේත ඉතා ම වැදගත් කාර්යභාරයක් ඉටු කරනු ලැබේ." දේශපාලන සංකේත **දෙකක්** නම් කරන්න.

1. ..........................................................
2. ..........................................................

EXAMMOOD.LK
EXAMMOOD.LK

11. "1832 කෝල්බෲක් කොමිසමේ නිර්දේශ ක්‍රියාවට නැංවීමෙන් පසුව ශ්‍රී ලංකාව තුළ වැඩවසම් ක්‍රමය වියැකී ගියේ ය." එහි ප්‍රතිඵල **දෙකක්** සඳහන් කරන්න.
1. ......................................................................................................................................
2. ......................................................................................................................................

12. බ්‍රිතාන්‍ය යටත් විජිත පාලන සමය තුළ 19 වන සියවසේ අගභාගයේ දී ශ්‍රී ලංකාවේ පැන නැගුණ සමාජ ව්‍යාපාර **දෙකක්** නම් කරන්න.
1. ......................................................................................................................................
2. ......................................................................................................................................

13. "ඩොනමෝර් කොමිසමේ නිර්දේශය පරිදි 1931 දී ශ්‍රී ලංකාවට සර්වජන ඡන්ද බලය ප්‍රදානය කළේ ය." එම තීරණයට එළඹීම කෙරෙහි ඩොනමෝර් කොමිසමට බලපෑම් කළ සාධක **දෙකක්** දක්වන්න.
1. ......................................................................................................................................
2. ......................................................................................................................................

14. "සෝල්බරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ නිර්මාණය කළ පාර්ලිමේන්තුවට නීති පැනවීම සම්බන්ධයෙන් පූර්ණ ස්වාධිපති බලය පවරා නොදුන් බව පොදුවේ පිළිගත් මතය විය." එම පාර්ලිමේන්තුවේ ස්වාධිපති බලයට පනවා තිබූ සීමාවන් **දෙකක්** නම් කරන්න.
1. ......................................................................................................................................
2. ......................................................................................................................................

15. 1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ පිහිට වූ විශේෂිත ව්‍යවස්ථාපිත ආයතන **දෙකක්** නම් කරන්න.
1. ......................................................................................................................................
2. ......................................................................................................................................

16. "1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ ජාතික රාජ්‍ය සභාව නිර්මාණය කරනු ලැබුවේ පාර්ලිමේන්තු ස්වාධිපත්‍ය න්‍යාය පදනම් කරගෙන ය." පාර්ලිමේන්තු ස්වාධිපත්‍යයට අදාළ විධිවිධාන **දෙකක්** නම් කරන්න.
1. ......................................................................................................................................
2. ......................................................................................................................................

17. "1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව ජනාධිපතිවරයා දෝෂාභියෝගයට ලක්කළ හැක්කේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විශේෂයෙන් දක්වා තිබෙන චෝදනා කිහිපයක් සම්බන්ධයෙන් පමණි." එම චෝදනාවලින් **දෙකක්** දක්වන්න.
1. ......................................................................................................................................
2. ......................................................................................................................................

18. "1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් ගොඩනගන ලද ශ්‍රේෂ්ඨාධිකරණයට ව්‍යවස්ථාව මගින් කරුණු දෙකක් සම්බන්ධයෙන් තනි අවසාන අධිකරණ බලය පවරා ඇත." එම කරුණු **දෙක** නම් කරන්න.
1. ......................................................................................................................................
2. ......................................................................................................................................

19. දකුණු ආසියාතික කලාපීය සහයෝගිතා සංවිධානයේ අරමුණු **දෙකක්** සඳහන් කරන්න.
1. ......................................................................................................................................
2. ......................................................................................................................................

20. එක්සත් ජාතීන්ගේ සංවිධානයේ අරමුණු **දෙකක්** දක්වන්න.
1. ......................................................................................................................................
2. ......................................................................................................................................

*****

EXAMMOOD.lk
EXAMMOOD.lk

# දේශපාලන විද්‍යාවේ මූලිකාංග II

ප්‍රශ්න පත්‍රය

**උපදෙස් :-** **B** හා **C** කොටස්වලින් ප්‍රශ්න **දෙක** බැගින් තෝරාගෙන ප්‍රශ්න **හතරකට** පමණක් පිළිතුරු සපයන්න.

## B කොටස

01. "දේශපාලන විද්‍යාව සමාජීය විද්‍යාවක් සේ සැලකේ." සාකච්ඡා කරන්න. (ලකුණු 20 යි)

02. පහත දැක්වෙන ඒවායින් **දෙකක්** විමසන්න.
   (i) රාජ්‍ය පිළිබඳ ලිබරල් මතය
   (ii) රාජ්‍ය පිළිබඳ මාක්ස්වාදී මතය
   (iii) මිනිසුන් දේශපාලනය ඉගෙන ගන්නා ආකාරය
   (iv) දේශපාලනය සහ දේශපාලන විද්‍යාව (ලකුණු 10 × 2 = 20 යි)

03. පහත දැක්වෙන ඒවායින් **දෙකක්** සාකච්ඡා කරන්න.
   (i) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක කාර්යභාරය
   (ii) අධිකරණයේ ස්වාධීනත්වය
   (iii) ජනමාධ්‍ය සහ දේශපාලනය
   (iv) සිවිල් සමාජය (ලකුණු 10 × 2 = 20 යි)

04. පහත දැක්වෙන ඒවායින් **දෙකක්** කෙටියෙන් විමසන්න.
   (i) ඇමෙරිකා එක්සත් ජනපදයේ ජනාධිපතිවරයාගේ බලතල හා කාර්යයන්
   (ii) ස්විට්සර්ලන්තයේ සාමූහික විධායකය
   (iii) බ්‍රිතාන්‍යයේ **හෝ** ඉන්දියාවේ **හෝ** නාමික විධායකයේ බලතල හා තත්ත්වය
   (iv) ප්‍රංශ ජනාධිපතිවරයාගේ බලතල සහ කාර්යයන් (ලකුණු 10 × 2 = 20 යි)

## C කොටස

05. ශ්‍රී ලංකාවේ බ්‍රිතාන්‍ය යටත් විජිත පාලනයේ දේශපාලන, ආර්ථික හා සමාජ ප්‍රතිඵල විචාරාත්මකව විමසන්න. (ලකුණු 20 යි)

06. 1931 දී ඩොනමෝර් කොමිසම විසින් සර්වජන ඡන්ද බලය ප්‍රදානය කිරීමෙන් සිදු වූ බලපෑම විමසන්න. (ලකුණු 20 යි)

07. පහත දැක්වෙන ඒවා විමසන්න.
   (i) 1972 ව්‍යවස්ථාව යටතේ ජාතික රාජ්‍ය සභාවේ තත්ත්වය
   (ii) 1978 ව්‍යවස්ථාව යටතේ පාර්ලිමේන්තුවේ තත්ත්වය (ලකුණු 10 × 2 = 20 යි)

08. 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ආශ්‍රිතව පහත දැක්වෙන ඒවා විමසන්න.
   (i) ජනාධිපතිවරයා විධායකයේ නායකයා ලෙස
   (ii) ජනාධිපතිවරයා ආණ්ඩුවේ නායකයා ලෙස
   (iii) ජනාධිපතිවරයා රාජ්‍ය නායකයා ලෙස
   (iv) ජනාධිපතිවරයා සහ පාර්ලිමේන්තුව අතර සම්බන්ධතාවය (ලකුණු 05 × 4 = 20 යි)

*****

EXAMMOOD.LK
EXAMMOOD.LK